# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2097/39 - 2018 නොවැම්බර් මස 16 වැනි සිකුරාදා - 2018.11.16**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**සුරාබදු ආඥාපනත**

සුරාබදු නිවේදනය

**ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන පානීය නොවන ස්ප්‍රීතු සඳහා වූ රීති සංශෝධනය**

සංශෝධනය කරන පරිදි සුරාබදු ආඥාපනතේ (52 වන අධිකාරය වූ) 32 වන වගන්තිය සමග කියවිය යුතු 2, 12, 22 සහ 25 වන වගන්ති යටතේ මුදල් විෂයභාර අමාත්‍යතුමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2018 පෙබරවාරි මස 21 වන දින අංක 2059/32 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක 07/2018 දරන සුරාබදු නිවේදනය, පානීය නොවන ස්ප්‍රීතු ආනයනය සඳහා රීති යාවත්කාලීන කිරීම සහ පහසු කිරීමේ අරමුණින් සංශෝධන ඇතුළත්ව 2018 ජුනි මස 13 දිනැති අංක 2075/23 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක 10/2018 දරන සුරාබදු නිවේදනය 2018 සැප්තැම්බර් මස 20 දින පාර්ලිමේන්තුවේ සම්මත වූ බවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

එස්. ආර්. ආටිගල,<br>
ලේකම්,<br>
මුදල් හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය.

2018 නොවැම්බර් මස 15 වැනි දින,<br>
කොළඹ 01,<br>
මුදල් හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ දී ය.

**රීති**

1. 3 වන ඡේදයේ V උප වගන්තියේ ''පානීය නොවන ස්ප්‍රීතු'' යන වචනය ඉවත් කර ''මෙතන්. I. ඕල් ($CH_3$- OH) ස්ප්‍රීතු'' යන වචනය ආදේශ කිරීමෙන් හා ''අනුමත ආයතනයෙන්'' යන වචන ඉවත් කර ''අනුමත ආයතනයන්'' යන වචන ආදේශ කිරීමෙන්,

2. 3 වන ඡේදයේ V උප වගන්තියේ පළමු ඡේදය අවසන් වූ වහාම පහත සඳහන් ඡේදය ඇතුළත් කිරීමෙන්,

   ''මෙම නිවේදනයේ I වන උපලේඛනයේ සඳහන් අනෙකුත් පානීය නොවන ස්ප්‍රීතු සඳහා අනුමත විපරිතකාරක එකතු කළ යුතු බවට නියම කිරීමට කොමසාරිස් ජනරාල්වරයාට බලය ඇත.''

3. 5 වන ඡේදය අවසන් වූ වහාම පහත සඳහන් ඡේදය 6 වන ඡේදය ලෙස ඇතුළත් කිරීමෙන්,

   ''6. සුරාබදු ස්ථානාධිපති, සුරාබදු අධිකාරී, සහකාර සුරාබදු කොමසාරිස්ගේ නිර්දේශ මත බලපත්‍ර කාලසීමාවට අදාළව බලපත්‍රධාරී ලබා ගැනීමට අපේක්ෂිත පානීය නොවන ස්ප්‍රීතු ප්‍රමාණය සඳහා අනුමත ලිපියක් කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ යුතු ය.''

4. II වන උපලේඛනයේ I ආකෘතියේ 7 හි iii වන කරුණ ලෙස පහත සඳහන් වගන්තිය ආදේශ කිරීමෙන්,

''iii. වාර්ෂිකව ආනයනය කිරීමට අපේක්ෂිත පානීය නොවන ස්ප්‍රීතු ප්‍රමාණය (වර්ග අනුව වෙන් වෙන් වශයෙන්)''

5. II වන උපලේඛනයේ II වන ආකෘතියේ 6 ii හි ''(නාමමාත්‍ර ඉන්වොයිසිය ඇමිණිය යුතු ය)'' යන වචන අවසන් වූ වහාම ''(එසේ වුවද ප්‍රායෝගික ගැටළු මතු වන අවස්ථාවක දී නාමමාත්‍ර ඉන්වොයිසිය කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි ඉවත් කල හැක.)'' යන වචන ආදේශ කිරීමෙන්,

6. II වන උපලේඛනයේ II ආකෘතියේ අංක 7 වගන්තිය ඉවත් කර පහත සඳහන් නව වගන්තිය ආදේශ කිරීමෙන් ''7. සෑම ඉල්ලුම් පත්‍රයක්ම අදාළ සුරාබදු ස්ථානාධිපතිගේ නිර්දේශ සහිතව සෘජුවම සුරාබදු කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු ය.''

7. III වන උපලේඛනයේ I වන තීරයේ 1 හා 2 හි ''අලෙවිය'' යන වචනය ඉවත් කර ''විකිණීම'' යන වචනය ආදේශ කිරීමෙන්,

8. iv වන උපලේඛනයේ I ආකෘතියේ 7 වන කොන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් කොන්දේසිය ආදේශ කිරීමෙන් ''තක්කාලීන සුරාබදු නිවේදන කොන්දේසි හා බලපත්‍ර කොන්දේසි කඩ කළහොත් සුරාබදු ආඥාපනතේ (52 අධිකාරය වූ) 56 හෝ 48 යටතේ ක්‍රියා කරනු ලබයි.''

9. iv වන උපලේඛනයේ II ආකෘතියෙහි මාතෘකාවෙහි ''බලය ලත් වෙළඳුන් සඳහා'' යන වචන ඉවත් කිරීමෙන්,

10. iv වන උපලේඛනයේ II ආකෘතියෙහි 7 වන කොන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් නව කොන්දේසිය එකතු කිරීමෙන් ''තත්කාලීන සුරාබදු නිවේදන කොන්දේසි හා බලපත්‍ර කොන්දේසි කඩ කළහොත් සුරාබදු ආඥාපනතේ (52 අධිකාරය වූ) 56 හෝ 48 යටතේ ක්‍රියා කරනු ලබයි.''

11. iv වන උපලේඛනයේ III ආකෘතියෙහි මාතෘකාව ඉවත් කර පහත සඳහන් නව මාතෘකාව ආදේශ කිරීමෙන් ''පානීය නොවන ස්ප්‍රීතු ගබඩා කිරීම හා විකිණීම සඳහා වූ බලපත්‍රය (18 වන වගන්තිය)''

12. iv වන උපලේඛනයේ III ආකෘතියෙහි වගුවේ අංක 1 හි දැක්වෙන පහත සඳහන් වචන ''(තොග/සිල්ලර)'', ''විවෘත හා අවසන් කරන වේලාවන්.'' ඉවත් කිරීමෙන් සහ ''(ගබඩා කිරීමේ/සිල්ලරට විකිණීමේ)'' යන්න ආදේශ කිරීමෙන්,

13. iv වන උපලේඛනයේ III ආකෘතියෙහි වගුවෙහි අංක 6 (i) හි සඳහන් ''පානීය නොවන ස්ප්‍රීතු තොග'' යන්න වෙනුවට ''පානීය නොවන ස්ප්‍රීතු ගබඩා කිරීමේ'' යන වචන ආදේශ කිරීමෙන්,

14. iv වන උපලේඛනයේ III ආකෘතියෙහි වගුවෙහි අංක 6 ''බලපත්‍ර දීමේ අධිකාරිය'' යන වචන වෙනුවට ''සුරාබදු කොමසාරිස් ජනරාල්'' යන වචන ආදේශ කිරීමෙන්,

15. iv වන උපලේඛනයේ III ආකෘතියෙහි කොන්දේසි අංක 1 හි ''තොග/සිල්ලරට විකිණීම සඳහා'' යන වචන වෙනුවට ''ගබඩා කිරීම සහ සිල්ලරට විකිණීම සඳහා'' යන වචන ආදේශ කිරීමෙන්,

16. iv වන උපලේඛනයේ III ආකෘතියෙහි කොන්දේසි අංක 3 හි ''පානීය නොවන ස්ප්‍රීතු සෑම තොග'' යන්න වෙනුවට ''පානීය නොවන ස්ප්‍රීතු සෑම ගබඩා කරන්නෙකුම'' යන වචන ආදේශ කිරීමෙන්,

17. iv වන උපලේඛනයේ III ආකෘතියෙහි කොන්දේසි අංක 5 හි ''කිලෝ ග්‍රෑම් 4.5'' යන වචන වෙනුවට ''කිලෝ ග්‍රෑම් 7.5'' යන්න ආදේශ කිරීමෙන්,

18. iv වන උපලේඛනයේ III ආකෘතියෙහි කොන්දේසි අංක 6 හි ''කිලෝ ග්‍රෑම් 600'' යන වචන වෙනුවට ''කිලෝ ග්‍රෑම් 1000'' ලෙස ආදේශ කිරීමෙන්,

19. iv වන උපලේඛනයේ IV ආකෘතියෙහි වගුවේ අංක 1 ''බලපත්‍රයේ'' යන වචනය ඉවත් කිරීමෙන්,

20. vi වන උපලේඛනයේ II වන ආකෘතියෙහි ''කොළඹ'' යන වචනය ඉවත් කර ''රාජගිරිය'' ලෙස ආදේශ කිරීමෙන් සහ ''බලයලත් රේගු නිළධාරි'' යන වචන අවසන් වූ වහාම ''බලයලත් ආයෝජන මණ්ඩල නිලධාරී'' ලෙස ඇතුළත් කරමින් සංශෝධනය කිරීමෙන්,

11 - 1401

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.